Build Future ..... Restore Past

# කාර්ය සාධන වාර්තාව- 2016



ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය

# පටුන

හැඳින්වීම.....3
සංස්ථානික තොරතුරු.....3
දැක්ම.....4
මෙහෙවර.....4
තත්ත්ව ප්‍රතිපත්තිය.....4
අධිකාරිය සහ වගකීම.....5
දෙපාර්තමේන්තුවේ සහතිකය.....5
කළමනාකාරීත්වය.....6
සපයන සේවාවන්.....7
ප්‍රාදේශීය කාර්යාල.....8
අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රකාශය.....9
2016 දක්වා අතීත කාර්ය සාධනය.....10
2016 වසරේ ව්‍යාපෘතිවල සාරාංශය.....11
උපදේශන අංශයේ කාර්ය සාධනය.....12
ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් - 2016.....13
අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති සීමාවන්ගේ සත්‍ය ප්‍රකාශනය-2016.....13
වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනේ කාර්ය සාධනය -2016.....14
යෝජිත වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන -2017.....15
කලාපීය කාර්ය සාධනය.....16
කලාපය 1 ඉදිකිරීම්.....16
කාර්ය සාධනය.....16
සම්පූර්ණ කළ ව්‍යාපෘති.....16
කලාපය 1 නඩත්තුව.....17
කාර්ය සාධනය.....17
සම්පූර්ණ කළ ව්‍යාපෘති.....17
කලාපය 2.....18
කාර්ය සාධනය.....18
සම්පූර්ණ කළ ව්‍යාපෘති.....18
කලාපය 3.....19
කාර්ය සාධනය.....19
සම්පූර්ණ කළ ව්‍යාපෘති.....19
කලාපය 4.....20
කාර්ය සාධනය.....20

සම්පූර්ණ කළ ව්‍යාපෘති ....................................................20
කලාපය 5 ....................................................21
කාර්ය සාධනය ....................................................21
සම්පූර්ණ කළ ව්‍යාපෘති ....................................................21
කලාපය 6 ....................................................22
කාර්ය සාධනය ....................................................22
සම්පූර්ණ කළ ව්‍යාපෘති ....................................................22
මානව සම්පත් ....................................................23
මානව සම්පත්-ශක්තිය ....................................................24
ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ ප්‍රකාශය ....................................................25
විගණකාධිපති වාර්තාව ....................................................26

පැතිකඩ

## හැඳින්වීම


රාජ්‍ය වැඩ දෙපාර්තමේන්තුව (PWD) යටතේ ක්‍රියාත්මක වූ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1969 දී ස්ථාපිත කරන ලද අතර දශක 4 ක පමණ කාලයක් පුරා ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වගකියනු ලබන ස්වාධීන ආයතනයක් ලෙස පවතී. මෙම දෙපාර්තමේන්තුව ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් කටයුතු ක්ෂේත්‍රය තුළ පූර්ණ අධිකාරිය සහ උපදේශන ආයතනය වෙයි. ගොඩනැගීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී සහ එම වැඩසටහන් සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ගයන් සම්බන්ධව කටයුතු කිරීමේදී විශේෂඥ උපදෙස් ගැනීම පිණිස එය කැඳවනු ලබයි.

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය, මූල්‍ය රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ සහ ගැසට් නිවේදනය තුළ දක්වා ඇත. ජාතික සංවර්ධනය තුළ සහ රාජ්‍ය ගොඩනැගිලි වත්කම් සංරක්ෂණයේදී දෙපාර්තමේන්තුව අනගිභවනීය කාර්ය භාරයක් ඉටු කරනු ලබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කළ 13 වෙනි සංශෝධනයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කෙරිණි. ශ්‍රී ලංකාවේ රජයේ ගොඩනැගිලි සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ වගකීම සම්බන්ධව අධිකාරිය සහ වගකීම ඇත්තේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවටයි. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ISO 9001:2008 ලබා ඇත. ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික වගවීම වෙත විශේෂ අවධානයක් යෙදවීම තුළින් දෙපාර්තමේන්තුව තම වගකීම ප්‍රති අර්ථකථනය කරයි.

## සංස්ථානික තොරතුරු

| | | |
|---|---|---|
| **නම** | - | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව |
| **නෛතික තත්ත්වය** | - | සම්පූර්ණයෙන්ම රජයට හිමිය |
| **අමාත්‍යාංශය** | - | නිවාස සහ ඉදිකිරීම් |
| **කාර්යාලය** | - | දෙවන මහල |
| | | සෙත්සිරිපාය, බත්තරමුල්ල |
| | | ශ්‍රී ලංකාව |
| | | දුර. 94 11 2862588 ෆැක්ස්. 94 11 2864771 |
| | | විද්‍යුත් තැපැල dgb@buildingsdept.gov.lk |
| | | වෙබ්. www.buildingsdept.gov.lk |



දැක්ම

මෙහෙවර

ප්‍රතිපත්තිය

## දැක්ම

ජාතියට ගුණාත්මකභාවයෙන් ඉහළ සේවාවන් සැපයීම සඳහා රාජ්‍ය අංශයේ ආයතන සතුව ආරක්ෂිත, අරපිරිමැසුම් දායක, තිරසර සහ දර්ශනීය ඉදිකිරීම් පරිසරයක් තිබෙන බව සහතික කිරීම පිණිස ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යයන්හි තාක්ෂණික බල අධිකාරිය බවට පත්වීම.

## මෙහෙවර

කැපවීමෙන් කටයුතුකරන, විවිධ ක්ෂේත්‍රවල නිපුණ, වෘත්තීයවේදීන් කණ්ඩායමක් විසින් පාර්ශවකරුවන්ගේ පූර්ණ සංතෘප්තිය උදෙසා ගුණාත්මකභාවය පිළිබඳ තාක්ෂණික වගවීම, සකසුරුවම, ක්‍රියාකාරීත්වය සහ මනා තත්වය සහතික කරමින් වාස්තු විද්‍යාත්මක නිර්මාණ, ඉංජිනේරු සැලසුම්, ඉදිකිරීම්, නඩත්තු කිරීම්, ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික සහාය සපයාදීම මගින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි කටයුතු සංවර්ධනය සඳහා විශිෂ්ඨ සේවාවවක් සැපයීම.

## තත්ත්ව ප්‍රතිපත්තිය

පහත තත්ත්වයන් සපුරමින් රාජ්‍ය අංශයේ ගොඩනැගීම් වැඩකටයුතු සංවර්ධනය සඳහා අනගිභවනීය සේවයක් සැපයීමේ වගකීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සතු වෙයි.

- අපේක්ෂාවන් අභිබවා යන වෘත්තීමය සේවාවක් සැපයීම තුළින් සේවාදායකයින් තෘප්තිමත් කිරීම.
- සේවාදායක ප්‍රතිපෝෂණයන් අධීක්ෂණය කිරීමෙන් සහ දැනුම යාවත් කාලීන කරගනිමින් අපගේ සේවාව වැඩි දියුණු කරගැනීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කිරීම.
- කණ්ඩායම් වැඩ කටයුතු තුළින් අපගේ බහුඅාංශික වෘත්තිකයන්ගේ පූර්ණ සහභාගීත්වය ලබාගැනීම.
- ISO 9001:2008 තත්ව කළමනාකරණ පද්ධතියේ අවශ්‍යතාවයන් සමග අනුගත වීම සහ අඛණ්ඩව QMS වැඩි දියුණු කිරීම.

අධිකාරිය

# අධිකාරිය සහ වගකීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මූල්‍ය රෙගුලාසි අංක 787, 788, 789 සහ 790 යටතේ බලතල පැවරී ඇත. ඒ අනුව, තාක්ෂණික නොවන දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන සඳහා දෙපාර්තමේන්තුව පහත වගකීම් දරයි.

1. රජයේ දෙපාර්තමේන්තු සහ නියෝජිතායතනවල වැය ශීර්ෂය තුළ සපයා ඇති මූල්‍ය ප්‍රතිපාදන අනුව ගොඩනැගිලි සැලසුම්, තක්සේරු සහ ඉදිකිරීම් සහ අදාළ පහසුකම් සැපයීම.
2. ගොඩනැගීම් සඳහා උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් සැපයීම.
3. රජයේ ගොඩනැගිලිවල නඩත්තුව, අලුතින් එක් කිරීම් සහ වැඩි දියුණු කිරීම
4. රජයේ රෝහල්වල මල ප්‍රවාහන පද්ධති නඩත්තුව සහ මෙහෙයුම හා එහි මනා ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම.
5. රජයේ නිවාසවල නඩත්තුව සහ මෙහෙයුම් කටයුතු
6. දෙපාර්තමේන්තුව මගින් සිදු කරන සියලු ගොඩනැගීම් කටයුතුවල තාක්ෂණික වගවීම තහවුරු කිරීම.
7. විදේශ දූත මණ්ඩල ව්‍යාපෘති.

අපගේ බැඳියාවන් සමග වඩාත් අනුගත වීම පිණිස දෙපාර්තමේන්තුව අවබෝධතා ගිවිසුමක් මගින් ඒකඟතාවයකට පැමිණ සේවාවන් සපයනු ලැබේ.

සහතිකය

# දෙපාර්තමේන්තුවේ සහතිකය

සේවාදායකයාගේ තාක්ෂණික සහ කළමනාකරණ ධාරිතාව සලකා බලමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සක්‍රිය සහයක් ලබාදෙනු ලබේ. ඉදිකිරීම් සඳහා සහතිකයක් ලබාදීමට ඇති අවශ්‍යතාවය අපි අගය කරන අතර පහත ක්‍රියාමාර්ග තුළින් අවදානම අඩු කරගැනීමට වගකියන්නෙමු:

a. *යාවජීව තාක්ෂණික/මූල්‍ය වගවීම*

b. සම්පූර්ණ ගොඩනැගිල්ල සඳහා බලයලත් ඉහළම වෘත්තිකයන් වෙතින් සැලසුම්

c. සියලුම රීති,රෙගුලාසි සහ තත්ව හා ආරක්ෂක ප්‍රමිතීන්ට අනුගත වේ

d. අතීත අත්දැකීම් භාවිතා කරමින් විශේෂයෙන් සංවර්ධනය කළ අති නිරවද්‍ය විෂය පථය

e. අනෙකුත් සේවා සපයන්නන්ගේ සැලසුම්, ලේඛන යනාදිය පරීක්ෂා කර තත්ත්වය සහ ආරක්ෂාව තහවුරු කිරීම

f. *කොන්ත්‍රාත් කළමනාකරණය කිරීම*

g. අත්දැකීම්ලත් වෘත්තීය ව්‍යාපෘති කළමනාකරණ සේවය විසින් තහවුරු කළ අගය

h. කළමනාකරණ විගණනවල මතුවන ගැටළුවලදී සහය ලබාදීම

**i.** ගිවිසුම් නීතිමය කටයුතුවලදී සහය ලබාදීම

j. තාක්ෂණික ඇගයීම් සහ ප්‍රසම්පාදන කමිටුවලට සහභාගි වී තාක්ෂණික සහය ලබාදීම

*වටිනාකම*

*තාක්ෂණිකව සහ මූල්‍යමය වශයෙන් වගකීම බාරගැනීම මගින් සේවා ලාභියා මුහුණපාන අවදානම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් අවම කර තමන් සිදුකරන ඉදිකිරීම සඳහා වටිනාකම තහවුරු කර සේවා ලාභියාට ආයු කාලය පුරා පවතින සහතිකවීමක් ලබා දෙයි.*

# කළමනාකාරීත්වය

කළමනාකාරීත්වය

| | | |
|---|---|---|
| **ඉංජි.එම්.ආර්.ජෙයචන්ද්‍රන්** | - | අධ්‍යක්ෂ ජනරාල් |
| **ඉංජි.එම්.එච්.එම්.ඉස්මයිල්** | - | වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු සේවා) |
| **වාස්තු විද්‍යාඥ සන්ධ්‍යා මෙන්ඩිස් (මෙය)** | - | වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (උපදේශන සේවා) |
| **ඉංජි.එම්.එච්.එම්.ඉස්මයිල්** | - | අධ්‍යක්ෂ (ඉංජිනේරු සැලසුම්) |
| **එස්.ඩී. අතාවුද ආරච්චි මෙය** | - | අධ්‍යක්ෂ (පරිපාලන) |
| **එම් එම්.එම්.හුසයින්ඩීන් මහතා** | - | ප්‍රධාන ගණකාධිකාරී |
| **ඉංජි. ඩබ්.ඒ.ඩබ්. අබේවර්ධන මහත්මිය** | - | අධ්‍යක්ෂ (ඉදිකිරීම් කලාපය 1) |
| **ඉංජි ඒ.නවාස් අතම්** | - | අධ්‍යක්ෂ (ඉදිකිරීම් කලාපය 2) |
| **ඉංජි කේ.ජී සන්ධ්‍යා කුමුදුනී මෙය** | - | අධ්‍යක්ෂ (තාක්ෂණික සංවර්ධන) |
| **එස්.නරසිංහ මෙය** | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| **වාස්තු විද්‍යාඥ මේනක මංගලනාථ** | - | වැඩ බලන අධ්‍යක්ෂ (වාස්තු විද්‍යාඥ) |

සේවාව

# සපයන සේවාවන්

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සේවාදායකයන්ට තම අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හා තම ගොඩනැගිලි, යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සාක්ෂාත් කරගැනීමේලා ඇතිවෙන ධාරිතා පරතරය පිරවීමට කටයුතු කරයි.

**ව්‍යාපෘති යෝජනා (මෙහි කාර්යය වන්නේ සේවාදායකයා හඳුනාගත් ව්‍යාපෘති සඳහා පහසුකම් සැපයීමයි)**

ව්‍යාපෘති අනුමැතීන් ලබාගැනීමට සහ මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට සහය වීම පිණිස සේවාදායකයන් සඳහා ව්‍යාපෘති සාරාංශ, ශක්‍යතා වාර්තා, පිරිවැය ඇස්තමේන්තු සහ තාක්ෂණික සහය ලබාදීම අපි සිදුකරන්නෙමු.

**කාර්ය නිෂ්ඨාව (ව්‍යවසායක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)**
සැලසුම් සැකසීම, සම්පූර්ණ කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන සියල්ල සඳහා අපි සම්පූර්ණ වගකීම භාරගන්නෙමු. සේවාදායකයාට ඇත්තේ සිදුවිය යුතු සියල්ල සිදුවීමට අවශ්‍ය යතුර යෙදීම පමණි.
මූල්‍ය රෙගුලාසිවල දක්වා ඇති පරිදි, පහත ආකාරයෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අරමුදල් නිකුත් කෙරේ: ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්වරයා නමට නිකුත් කෙරුණු චෙක් පතක් හෝ වැය ශීර්ෂයක් මාරු කිරීමෙන්.

**උපදේශනය (ව්‍යවසායක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)**
අප විසින් පූර්ව කොන්ත්‍රාත් වගකීම ලෙස ශක්‍යතා වාර්තා සැකසීම, සැලසුම් නිර්මාණය කිරීම, ප්‍රමාණ පත්‍ර සැකසීම සහ ලංසු ලේඛණකරණය කරනු ලැබෙන අතර පශ්චාත් කොන්ත්‍රාත් වගකීම ලෙස ඉදිකිරීම් කළමණාකරණ සේවාවන් සපයනු ලැබේ. ලංසු ක්‍රියාවලියේ වගකීම සේවාදායකයා විසින් ගනු ලැබේ. අරමුදල් සේවාදායකයා අත රැඳෙන අතර සේවාදායකයා විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කරනු ලැබේ.
**ව්‍යාපෘති කළමනාකරණය (ව්‍යවසායක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ/ උපදේශක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)**
කොන්ත්‍රාත් නියෝජිතායතන වෙත උපදේශනය සැපයීමේ වගකීම අප විසින් ගනු ලැබේ. ක්‍රියාත්මක කිරීමට භාරගැනීම හෝ ඒ සඳහා සේවාදායකයාට උපදෙස් දීම සිදු කෙරේ. BOT (ඉදිකිරීම, මෙහෙයවීම හා පැවරීම), BOOT (ඉදිකිරීම, හිමිකරගැනීම, මෙහෙයවීම සහ පැවරීම) යටතේ පුද්ගලික අංශයේ ආයෝජන වැඩසටහන් සහ රජයේ හෝ ප්‍රදායක නියෝජිතායතනවල නිමෙවුම් සහ ගොඩනැගීම් කොන්ත්‍රාත් අප විසින් භාරගනු ලැබේ.
අරමුදල් සේවාදායකයා අත රැඳෙන අතර සේවාදායකයා විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කරනු ලැබේ.

**නඩත්තුව, විශේෂ අලුත්වැඩියා, වැඩිදියුණු කිරීම් (කාර්ය භාරය වනුයේ සේවාදායකයාට පහසුකම් සැපයීමයි)**


තත්ව වාර්තා සැකසීම, නඩත්තු අත්පොත් සැකසීම, නඩත්තු ඇස්තමේන්තු සැකසීම, නඩත්තු ක්‍රියාත්මක කිරීම, ගොඩනැගිලි යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීමට භාරගනු ලැබේ.
සිදු කෙරෙන කටයුතු සඳහා අරමුදල් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට නිකුත් කෙරේ.

**ලබාදෙන වෙනත් සේවාවන්.**
අනෙක් ආයතනවල තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින් ලෙස නිසි නිලධාරීන් පත්කර ඒ සඳහා සහභාගි වෙනු ලැබේ.

සේවාව

# ප්‍රාදේශීය කාර්යාල

*"දිවයිනේ ස්ථාන හයක පිහිටා ඇති කලාපීය කාර්යාල හත හරහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සිය සේවාලාභීන්ට සේවා සපයනු ලබයි.."*




*රූපය 1 කලාප බෙදීමේ සිතියම*

# අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රකාශය

### ජාතික සංවර්ධනයට සිදුකර ඇති දායකත්වය

රටතුළ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිදු කෙරෙන සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා මෙම දෙපාර්තමේන්තුවේ පූර්ණ දායකත්වය ලබාදෙන ලදී. ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා අවශ්‍ය කරන ව්‍යාපෘති කළමනාකරණ සේවා වැඩි වශයෙන් සැපයීමට දෙපාර්තමේන්තුව සමත් විය.

### ISO 9001:2008 තත්ව සහතිකය ලබාගැනීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සහ මහනුවර ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 05) ISO 9001:2008 තත්ව ක්‍රියාත්මක කරමින් පවතී.

අනෙකුත් ප්‍රාදේශීය කාර්යාලද ISO තත්ව සහතිකය ලබාගැනීම සඳහා අදාළ ලේඛන සූදානම් කරමින් සිටිනු ලැබේ.

### ප්‍රගති සාරාංශය


2016 වර්ෂය තුළ අපේක්ෂිත අගයන්ට සාපේක්ෂව සමස්ථ මූල්‍ය ප්‍රගති ප්‍රතිශතය 81% ක් වේ.

### 2016 වර්ෂයේදී මුහුණ දෙන ලද බාධක

- කාර්ය මණ්ඩලය හිඟවීම
  - ඉංජිනේරුවරුන්,ගෘහ නිර්මාණ ශිල්පීන් සහ ප්‍රමාණ සමීක්ෂකයන්
  - තාක්ෂණික නිලධාරීන් සහ සැලසුම්කරුවන්
  - රාජ්‍ය කළමනාකරණ සහායකයින්
  - රියදුරන්
- වැඩපලවල් කරා යාම සඳහා වාහන හිඟකම
- හදිසි ව්‍යාපෘති සඳහා පැවරුම් පදනමින් උපදේශක සේවා ලබාගැනීම සඳහා අවසර නොමැතිවීම
- සංචාරක බංගලා නඩත්තුව/ වැඩිදියුණු කිරීම් සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් නොතිබීම
- අත්හිටවූ ව්‍යාපෘති සඳහා ගෙවීම් සිදු නොකිරීම
- ඉදිකිරීම් අදියරේදී සේවාදායකයින් විසින් ඉල්ලාසිටින වෙනස්කිරීම් හේතුවෙන් ව්‍යාපෘති ප්‍රමාදවීම
- කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රමාණවත් සම්පත් නොතිබීම හේතුවෙන් ව්‍යාපෘති නිසි කලට සම්පූර්ණ කිරීමට ඇති අපහසුතා

**ඉංජිනේරු.එම්.ආර්.ජෙයචන්ද්‍රන්**
අධ්‍යක්ෂ ජෙනරාල්
ගොඩනැගිලි දෙපාර්තමෙන්තුවේ

## 2016 දක්වා අතීත කාර්ය සාධනය




*රූපය 2: පසුගිය සය වසර සමග සන්සන්දනය*

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රජයේ ආයතනවල සේවාදායකයින්ට සේවාවන් සපයනු ලබයි. දෙපාර්තමේන්තුව වෙතින් සපයන ප්‍රධාන සේවාවන්, නව ගොඩනැගිලි සහ යටිතල පහසුකම් ඉදිකිරීම, ප්‍රතිසංස්කරණය ලෙස වර්ගීකරණය කළ හැකිය. රූපය 2 මගින් පෙන්වා දී ඇති පරිදි දෙපාර්තමේන්තුව 2010 වසරේ වූ මිලියන 516 ක කාර්ය සාධනයේ සිට 2016 මිලියන 3917 දක්වා වර්ධනය වී ඇති අතර ඒ අනුව 2010 සිට 2016 දක්වා දක්වා කාර්ය සාධනයේ වැඩිවීම 659% කි. 2010 වසරේ සිට 2016 දක්වා වාර්ෂික වර්ධනය 1 වගුවේ දක්වා ඇත.

*වගුව 1 2010-2016 දක්වා වාර්ෂික වර්ධනය*

| වසර | වාර්ෂික කාර්යසාධනය (මිලියන) | වර්ධනය % (පදනම් වර්ෂය 2010) | වර්ධනය % (පදනම් වර්ෂය පෙර වසර) |
|---|---|---|---|
| **2010** | 516.42 | | |
| **2011** | 632.95 | 23% | 23% |
| **2012** | 621.12 | 20% | -2% |
| **2013** | 1339.22 | 159% | 115% |
| **2014** | 1523.01 | 195% | 14% |
| **2015** | 2303.81 | 346% | 51% |
| **2016** | 3917.38 | 659% | 70% |

වගුව 2 මගින් දක්වා ඇති පරිදි 2015 සිට 2016 දක්වා දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය මිලියන 2303 සිට 3917 දක්වා වර්ධනය වී ඇත. පහත වගුව 2 මගින් ප්‍රතිසංස්කරණය සහ නව ගොඩනැගිලි යන ක්ෂේත්‍රවල කාර්ය සාධනය පෙන්වයි. 2015 සිට 2016 දක්වා කාලය තුළ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 66% කින්ද නව ගොඩනැගිලි ඉදිකිරීම් 71% කින්ද වර්ධනය වී ඇත.

*වගුව 2 -වාර්ෂික කාර්ය සාධනයේ ආංශික සන්සන්දනය*

| අංශය | වාර්ෂික කාර්යසාධනය (මිලියන) | | වර්ධන ප්‍රතිශතය |
|---|---|---|---|
| | 2015 | 2016 | |
| **ප්‍රතිසංස්කරණය** | 363.13 | 603.43 | 66% |
| **නව ගොඩනැගිලි** | 1940.68 | 3313.95 | 71% |
| එකතුව | **2303.81** | **3917.38** | **70%** |

## 2016 වසරේ ව්‍යාපෘතිවල සාරාංශය

තුන්වන වගුවේ දක්වා ඇති පරිදි දෙපාර්තමේන්තුව විසින් 2016 වසරේ දී ව්‍යාපෘති 476ක් ක්‍රියාත්මක කර ඇති අතර, ඒ අතුරින් ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 25 ට අඩු ව්‍යාපෘති 370 ක් ද, ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන (25-100)ත් අතර, ව්‍යාපෘති 64ක් ද, ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන (100-200)ත් අතර ව්‍යාපෘති 18ක් ද, රුපියල් මිලියන 200ට වැඩි ව්‍යාපෘති 24ක් ද, විය.

වගුව 3: 2016 වසරේ ඉදිකිරීම් අංශයේ සාරාංශය


| කලාප කාර්යාලය | ව්‍යාපෘති අගය රු. (මිලියන) | | | | |
|---|---|---|---|---|---|
| | **0-25** | **25-100** | **100-200** | **>200** | **එකතුව** |
| **කලාපය 1 ඉදිකිරීම්** | 7 | 10 | 2 | 5 | 24 |
| **කලාපය 1 නඩත්තුව** | 199 | 7 | 1 | 1 | 208 |
| **කලාපය 2** | 9 | 13 | 1 | 4 | 27 |
| **කලාපය 3** | 40 | 7 | 4 | 2 | 53 |
| **කලාපය 4** | 35 | 8 | 2 | 5 | 50 |
| **කලාපය 5** | 35 | 16 | 6 | 5 | 62 |
| **කලාපය 6** | 45 | 3 | 2 | 2 | 52 |
| එකතුව | **370** | **64** | **18** | **24** | **476** |

# උපදේශන අංශයේ කාර්ය සාධනය

දෙපාර්තමේන්තුව විසින් සපයන සේවාවන්ගේ මධ්‍යය වන්නේ උපදේශන අංශයයි. මෙම අංශය විසින් ගොඩනැගිලි සහ අදාළ යටිතල පහසුකම් සඳහා වාස්තු විද්‍යාත්මක, ව්‍යුහාත්මක, විද්‍යුත්, ජල සැපයුම්, ජලාප්‍රවාහන සහ යාන්ත්‍රික නිමැවුම් යනාදී ආකාරවලින් සේවාවන් සපයන අතර ප්‍රමාණ පත්‍රද සකසයි. ඉහත සේවාවන් සපයනුයේ ඒ සඳහා කැපවූ වෘත්තීමය වාස්තු විද්‍යාඥයන් සහ ඉංජිනේරුවරුන් විසිනි. මෙම අංශය 2013 වසරේ මිලියන 2700 ක කාර්ය සාධනයක් පෙන්වූ අතර 2014 දී එය මිලියන 3308 ක්ද 2015 වසරේදී මිලියන 4342 ක්ද 2016 වසරේදී මිලියන 7236 ක්ද දක්වා වර්ධනය විය. පහත 4 වගුව 2016 වසරේ කාර්ය සාධනයන් ප්‍රමාණය පෙන්වන අතර 2013 සිට 2016 දක්වා කාර්ය සාධනය 3 වන රූපය මගින් පෙන්වයි.

*වගුව 4 -2016 වසරේදී ව්‍යාපෘති උපදේශන අංශයේ සාරාංශය*


| අංකය | විස්තරය | ව්‍යාපෘති ගණන | මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු .(මිලියන) |
|---|---|---|---|
| **1** | සැලසුම් අදියරේදී සම්පූර්ණ කළ ව්‍යාපෘති | 101 | |
| **2** | සේවාදායක අනුමැතීන් සඳහා වන දළ සැලසුම් | 64 | |
| **3** | ඉදිකිරීම් ඇදීමේ අදියරේ ව්‍යාපෘති | 20 | |
| **4** | 2016 වසර අවසානයේ සැකසෙමින් ඇති දළ සැලසුම් | 15 | |
| **5** | 2016 වසර අවසානයේ විමර්ශන අදියරේ පවතින ව්‍යාපෘති | 46 | |
| **6** | අයවැය යෝජනා 2017 | 02 | |
| | **මුළු ව්‍යාපෘති සංඛ්‍යාව** | **248** | **7236.35** |




| | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|
| ඉලක්කය(රු. මිලියන) | 0 | 3240 | 3900 | 6000 |
| ප්‍රගතිය (රු. මිලියන) | 2700 | 3308 | 4342 | 7236 |

රූපය 3 උපදේශන අංශයේ කාර්ය සාධනයේ ප්‍රස්තාරමය ඉදිරිපත් කිරීම


# ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් - 2016




| | ප්‍රාග්ධන අයවැය | පුනරාවර්තන අයවැය | එකතුව |
|---|---|---|---|
| වාර්ෂික ඇස්තමේන්තුව (රු. මිලියන) | 37.5 | 290.04 | 327.54 |
| පරිපූරක ප්‍රතිපාදන (රු. මිලියන) | 0 | 25.50 | 25.50 |
| එකතුව (රු.මිලියන) | 37.50 | 315.54 | 353.04 |
| වියදම | 36.37 | 309.00 | 345.36 |

*රූපය 4 ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම්වල ප්‍රස්තාරමය ඉදිරිපත් කිරීම*

# අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති සීමාවන්ගේ සත්‍ය ප්‍රකාශනය- 2016




| | උපරිම වියදම් සීමාව | ලැබීම් අවම සීමාව | හර ශේෂයේ උපරිම සීමාව |
|---|---|---|---|
| ඇස්තමේන්තුගත සීමා (රු. මිලියන) | 18.00 | 11.00 | 75.00 |
| ලැබුණු සීමා (රු. මිලියන) | 18.00 | 11.00 | 75.00 |
| සත්‍ය වියදම/ලැබීම් (රු. මිලියන) | 17.997 | 13.802 | 47.561 |

*රූපය 5 අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති සීමාවන්ගේ සත්‍ය ප්‍රස්තාරමය ඉදිරිපත් කිරීම*

# වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනේ කාර්ය සාධනය -2016

| | | කාර්ය නිෂ්ඨාව | | උපදේශනය | | ව්‍යාපෘති කළමනාකරණය | | නඩත්තුව | | වැඩි දියුණු කිරීම | | ප්‍රතිසංස්කරණය | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මුල්‍ය (මිලියන) | භෞතික % | මුල්‍ය (මිලියන) | භෞතික % | මුල්‍ය (මිලියන) | භෞතික % | මුල්‍ය (මිලියන) | භෞතික % | මුල්‍ය (මිලියන) | භෞතික % | මුල්‍ය (මිලියන) | භෞතික % | මුල්‍ය (මිලියන) | භෞතික % |
| කලාපය 1 ඉදිකිරීම් | ඉලක්කය | 157.91 | 100 | 506.53 | 100 | - | - | - | - | - | - | - | - | **664.44** | |
| | සත්‍ය | 147.88 | 75 | 399.72 | 67 | - | - | - | - | - | - | - | - | **547.60** | |
| කලාපය 1 නඩත්තුව | ඉලක්කය | 3.14 | 100 | 88.80 | 100 | 50.00 | 100 | 9.14 | 100 | 471.58 | 100 | 31.92 | 100 | **654.59** | |
| | සත්‍ය | 3.14 | 100 | 65.00 | 100 | 49.86 | 100 | 11.88 | 69 | 422.75 | 88 | 31.05 | 100 | **583.68** | |
| කලාපය 2 | ඉලක්කය | 136.00 | 100 | 612.37 | 100 | 101.00 | 100 | - | - | - | - | - | - | **823.87** | |
| | සත්‍ය | 118.06 | 85 | 507.57 | 73 | 86.00 | 83 | - | - | - | - | - | - | **711.63** | |
| කලාපය 3 | ඉලක්කය | 346.14 | 100 | 193.18 | 100 | - | - | 63.57 | 100 | 4.00 | 100 | - | - | **606.89** | |
| | සත්‍ය | 265.27 | 77 | 185.62 | 95 | - | - | 61.25 | 96 | 4.00 | 100 | - | - | **516.14** | |
| කලාපය 4 | ඉලක්කය | 217.25 | 100 | 408.93 | 100 | 77.94 | 100 | - | - | - | - | - | - | **704.12** | |
| | සත්‍ය | 170.90 | 80 | 435.90 | 61 | 77.94 | 95 | - | - | - | - | - | - | **684.74** | |
| කලාපය 5 | ඉලක්කය | 592.27 | 100 | 293.75 | 100 | 68.84 | 100 | 34.93 | 100 | - | - | - | - | **989.79** | |
| | සත්‍ය | 195.79 | 33 | 239.47 | 79 | 68.84 | 100 | 30.57 | 88 | - | - | - | - | **534.67** | |
| කලාපය 6 | ඉලක්කය | 79.43 | 100 | 67.16 | 100 | 181.00 | 100 | 42.11 | 100 | 3.05 | 100 | - | - | **372.75** | |
| | සත්‍ය | 73.32 | 91 | 56.10 | 80 | 167.57 | 85 | 39.52 | 100 | 2.41 | 81 | - | - | **338.92** | |
| එකතුව | ඉලක්කය | 1517.14 | | 2170.72 | | 468.28 | | 149.75 | | 442.50 | | 31.92 | | **4816.45** | |
| | සත්‍ය | 959.36 | | 1889.38 | | 439.71 | | 143.22 | | 393.03 | | 31.05 | | **3917.38** | |


# යෝජිත වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන -2017

| | | කාර්ය නිෂ්ඨාව | | උපදේශනය | | ව්‍යාපෘති කළමනාකරණය | | නඩත්තුව | | වැඩි දියුණු කිරීම | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූල්‍ය (මිලියන) | භෞතික % | මූල්‍ය (මිලියන) | භෞතික % | මූල්‍ය (මිලියන) | භෞතික % | මූල්‍ය (මිලියන) | භෞතික % | මූල්‍ය (මිලියන) | භෞතික % | මූල්‍ය (මිලියන) | භෞතික % |
| කලාපය 1 ඉදිකිරීම් | ඉලක්කය | 61.91 | 100 | 2096.86 | 100 | - | - | - | - | - | - | 2158.77 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාපය 1 නඩත්තු | ඉලක්කය | - | - | 128.20 | 100 | 219.42 | 100 | - | 100 | 136.69 | 100 | 484.31 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාපය 2 | ඉලක්කය | 304.51 | 100 | 598.72 | 100 | 242.79 | 100 | - | - | - | - | 1146.02 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාපය 3 | ඉලක්කය | 296.51 | 100 | 427.40 | 100 | - | - | - | 100 | - | 100 | 723.91 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාපය 4 | ඉලක්කය | 198.08 | 100 | 806.63 | 100 | 17.01 | 100 | 18.26 | 100 | - | - | 1039.98 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාපය 5 | ඉලක්කය | 769.08 | 100 | 392.99 | 100 | - | - | 244.66 | 100 | - | - | 1406.73 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාපය 6 | ඉලක්කය | 59.80 | 100 | - | - | 430.55 | 100 | 10.58 | 100 | - | - | 500.93 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| එකතුව | ඉලක්කය | 1689.89 | | 4450.80 | | 909.77 | | 273.50 | | 136.69 | | 7460.65 | |
| | සත්‍ය | | | | | | | | | | | | |

# කලාපීය කාර්ය සාධනය

## කලාපය 1 ඉදිකිරීම්

| | |
|---|---|
| **ප්‍රධාන ඉංජිනේරු** | **ඉංජි.ජී.එච්.ඒ.බී සජෝත** |
| **නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු** | ඉංජි.ජී.එච්.එන්.එන්. පෙරේරා |
| **කාර්යාලය** | ප්‍රධාන ඉංජිනේරුවරයාගේ කාර්යාලය (කලාපය 1 ඉදිකිරීම්)<br>අංක 213<br>ටොරින්ටන් පටුමග<br>කොළඹ 07 |
| **දුර 94 11 554691** | ෆැක්ස් 94 11 2554690 |
| **විද්‍යුත් තැපැල** | cecc@buildingsdept.gov.lk |




## කාර්ය සාධනය

*වගුව 5 1 කලාපයේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය ඉදිකිරීම් හි ප්‍රගතියේ සාරාංශය*


| | කාර්ය නිෂ්ඨාව | උපදේශනය | එකතුව |
|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (මිලියන) | 157.91 | 506.53 | **664.44** |
| මූල්‍ය ප්‍රගතිය (මිලියන) | 147.88 | 399.72 | **547.60** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 3 | 1 | **4** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 10 | 10 | **20** |

## සම්පූර්ණ කළ ව්‍යාපෘති

| මීගමුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලය සඳහා නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම (අදියර 11) | | සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත ආබාධිත පුද්ගලයන් සඳහා වන වෘත්තීය මුහුණු ආයතනය ඉදිකිරීම -අමුණුකුඹුර | |
|---|---|---|---|
| **මුළු තක්සේරු මුදල පිරිවැය** | මිලියන 96.36 | **මුළු තක්සේරු මුදල** | මිලියන 143.00 |
| **සේවාදායකයා** | කම්කරු සහ වෘත්තීය සබඳතා අමාත්‍යාංශය | **සේවාදායකයා** | සමාජ සවිබලගැන්වීමේ සහ සුබසාධන අමාත්‍යාංශය |
|  | |  | |

# කලාපය 1 නඩත්තුව

| | |
|---|---|
| **ප්‍රධාන ඉංජිනේරු** | **ඉංජි එම්. සත්‍යකුමාර්** |
| **නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු** | ඉංජි එස්.එම්.එම්. සිරිවර්ධන |
| **කාර්යාලය** | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය<br>(කලාපය 1 නඩත්තුව)<br>අංක 213<br>ටොරින්ටන් පටුමග<br>කොළඹ 07 |
| **දුර.94 11 2582579** | ෆැක්ස් 94 11 2588686 |
| **විද්‍යුත් තැපැල** | **cem@buildingsdept.gov.lk** |




# කාර්ය සාධනය

*වගුව 6 1 කලාපයේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය නඩත්තු හි ප්‍රගතියේ සාරාංශය*


| | කාර්ය නිෂ්ඨාව | උපදේශනය | ව්‍යාපෘති කළමනා කරණය | නඩත්තුව | වැඩි දියුණු කිරීම් | ප්‍රතිසංස් කරණය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය(මිලියන) | 3.14 | 88.80 | 50.00 | 9.14 | 471.58 | 31.92 | **654.59** |
| මූල්‍ය ප්‍රගතිය (මිලියන) | 3.14 | 65.00 | 49.86 | 11.88 | 422.75 | 31.05 | **583.68** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 1 | 1 | 3 | 7 | 181 | 2 | **195** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | - | - | - | 3 | 9 | - | **12** |

# සම්පූර්ණ කළ ව්‍යාපෘති

| ජා ඇල ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ පවතින කම්හල් ගොඩනැගිල්ලේ වැඩපෙදෙස් හතරක වහල 40'-0" ක උසකට එසවීම. | | කොළඹ 01 විදේශ කටයුතු අමාත්‍යාංශය සඳහා යෝජිත සෙලින්කෝ නිවසේ 2 වන මහල ප්‍රතිසංස්කරණය. | |
|---|---|---|---|
| මුළු තක්සේරු මුදල පිරිවැය | මිලියන 28.48 | මුළු තක්සේරු මුදල | මිලියන 39.83 |
| සේවාදායකයා | සෞඛ්‍ය අමාත්‍යාංශය | සේවාදායකයා | විදේශ කටයුතු අමාත්‍යාංශය |
|  | |  | |

## කලාපය 2

| | |
|---|---|
| **ප්‍රධාන ඉංජිනේරු** | **ඉංජි. එස් විනෝද්නි (මිය)** |
| **නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු** | ඉංජි. කේ තිරුකුමාර් |
| **කාර්යාලය** | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය<br>(කලාපය 2 )<br>වෙරළ පාර,<br>ගුරුනගර්,<br>යාපනය. |
| **දුර.94 21 2222781** | ෆැක්ස් 94 21 2222781 |
| **විද්‍යුත් තැපෑල** | **cej@buildingsdept.gov.lk** |




## කාර්ය සාධනය

*වගුව 7 2 කලාපයේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ ප්‍රගතියේ සාරාංශය*


| | කාර්ය නිෂ්ඨාව | උපදේශනය | ව්‍යාපෘති කළමනාකරණය | එකතුව |
|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (මිලියන) | 136.00 | 612.37 | 101.00 | **823.87** |
| මූල්‍ය ප්‍රගතිය (මිලියන) | 118.06 | 507.57 | 86.00 | **711.63** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 5 | - | 2 | **7** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 4 | 14 | 2 | **20** |

## සම්පූර්ණ කළ ව්‍යාපෘති

| යෝජිත යාපනය පළාත් කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යාල ගොඩනැගිල්ල, | | කිළිනොච්චි හි සත්ව විමර්ශන මධ්‍යස්ථානය ඉදිකිරීම | |
|---|---|---|---|
| මුළු තක්සේරු මුදල පිරිවැය | මිලියන 89.50 | මුළු තක්සේරු මුදල | මිලියන 46.91 |
| සේවාදායකයා | කම්කරු සහ වෘත්තීය සබඳතා අමාත්‍යාංශය | සේවාදායකයා | පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය |
|  | |  | |

# කලාපය 3

| | |
|---|---|
| **ප්‍රධාන ඉංජිනේරු** | **ඉංජි. ජී.ආර්.එස්.බී. ගම්ලත්** |
| **නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු** | ඉංජි.එස්.සුරේන්ද්‍රන් |
| **කාර්යාලය** | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාපය 3 )<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,<br>කුරුණෑගල |
| **දුර.94 37 2222197** | ෆැක්ස් 94 37 2222437 |
| **විද්‍යුත් තැපෑල** | cek@buildingsdept.gov.lk |




# කාර්ය සාධනය

*වගුව 8 3 කලාපයේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ ප්‍රගතියේ සාරාංශය*

| | කාර්ය නිෂ්ඨාව | උපදේශනය | නඩත්තුව | වැඩි දියුණු කිරීම් | එකතුව |
|---|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (මිලියන) | 346.14 | 193.18 | 63.57 | 4.00 | **606.89** |
| මූල්‍ය ප්‍රගතිය (මිලියන) | 265.27 | 185.62 | 61.25 | 4.00 | **516.14** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 12 | 5 | 22 | 1 | **40** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 9 | 3 | 1 | - | **13** |

# සම්පූර්ණ කළ ව්‍යාපෘති

| පැල්වැහැර කෘෂිකර්ම පාසල සඳහා නේවාසිකාගාරයක් ඉදි කිරීම | | කුරුණෑගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය ඉදිකිරීම, 1 අදියර | |
|---|---|---|---|
| මුළු තක්සේරු මුදල පිරිවැය | මිලියන 221.96 | මුළු තක්සේරු මුදල | මිලියන 158.00 |
| සේවාදායකයා | කෘෂිකර්ම අමාත්‍යාංශය | සේවාදායකයා | කම්කරු සහ වෘත්තීය සබඳතා අමාත්‍යාංශය |
|  | |  | |

## කලාපය 4

| | |
|---|---|
| **ප්‍රධාන ඉංජිනේරු** | **ඉංජි.කේ. ඉලන්කෝ** |
| **නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු** | ඉංජි.එස්.තුෂාන්ති(මෙය) |
| **කාර්යාලය** | ප්‍රධානඉංජිනේරුකාර්යාලය (කලාපය 4 )<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,<br>ඉඟිනියාගල පාර,<br>අම්පාර |
| **දුර.94 63 2224490** | ෆැක්ස් 94 63 2222437 |
| **විද්‍යුත් තැපෑල** | ceu@buildingsdept.gov.lk |




## කාර්ය සාධනය

| | **කාර්ය නිෂ්ඨාව** | **උපදේශනය** | **ව්‍යාපෘති කළමනාකරණය** | **එකතුව** |
|---|---|---|---|---|
| **මූල්‍ය ඉලක්කය (මිලියන)** | 217.25 | 408.93 | 77.94 | **704.12** |
| **මූල්‍යප්‍රගතිය (මිලියන)** | 170.90 | 435.90 | 77.94 | **684.74** |
| **සම්පූර්ණ කළව්‍යාපෘති (ගණන)** | 7 | 28 | 1 | **36** |
| **සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන)** | 4 | 9 | 1 | **14** |

*වගුව 9 4 කලාපයේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ ප්‍රගතියේ සාරාංශය*

## සම්පූර්ණ කළ ව්‍යාපෘති


| අම්පාර මහ රෝහලේ නොමේරු ළදරු ඒකකයක් ඉදි කිරීම | | වහාරෙයි සල්ලිතීවු දූව සංරක්ෂණය කිරීම තුළින් "සුපිරිසිදු පරිසර හිතකාමී සංස්කෘතියක් තුළ විවේකය සහ සතුට" මඩකලපුව, අදියර 1 | |
|---|---|---|---|
| **මුළු තක්සේරු මුදල පිරිවැය** | මිලියන 74.11 | මුළු තක්සේරු මුදල | මිලියන 20.00 |
| **සේවාදායකයා** | සෞඛ්‍ය අමාත්‍යාංශය | සේවාදායකයා | දිසාපති, මඩකලපුව |





# කලාපය 5

| | |
|---|---|
| **ප්‍රධාන ඉංජිනේරු** | **ඉංජිඑන්.එම්.එම්.මරික්කාර් මිය** |
| **නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු** | ඉංජි ඩී.සී.විජේසිංහ මිය |
| **කාර්යාලය** | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාපය 5 ) ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, මහනුවර |
| **දුර.94 81223 4255** | ෆැක්ස් 94 81 2234255 |
| **විද්‍යුත් තැපෑල** | cec@buildingsdept.gov.lk |




# කාර්ය සාධනය

*වගුව 10 5 කලාපයේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ ප්‍රගතියේ සාරාංශය*


| | කාර්ය නිෂ්ඨාව | උපදේශනය | ව්‍යාපෘති කළමනාකරණය | නඩත්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| **මූල්‍ය ඉලක්කය (මිලියන)** | 592.27 | *293.75* | 68.84 | 34.93 | **989.79** |
| **මූල්‍ය ප්‍රගතිය (මිලියන)** | 195.79 | 239.47 | 68.84 | 30.57 | **534.67** |
| **සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන)** | 6 | 4 | 1 | 8 | **19** |
| **සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන)** | 35 | 6 | - | 2 | **43** |

# සම්පූර්ණ කළ ව්‍යාපෘති

| ගන්නෝරුව, ජාතික කෘෂිකර්ම සහ තොරතුරු මධ්‍යස්ථානයසඳහා සය මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා ශ්‍රවණාගාරයක් ඉදිකිරීම | |
|---|---|---|---|
| **මුළු තක්සේර මුදල පිරිවැය** | මිලියන 338.67 | මුළු තක්සේරු මුදල | මිලියන 200.00 |
| **සේවාදායකයා** | කෘෂිකර්ම අමාත්‍යාංශය | සේවාදායකයා | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
|  | |  | |

# කලාපය 6

| | |
|---|---|
| **ප්‍රධාන ඉංජිනේරු** | **ඉංජි. කේ ලියනගේ මිය** |
| **නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු** | ඉංජි කේ.පී.ඒ. ගුණවර්ධන |
| **කාර්යාලය** | ප්‍රධාන ඉංජිනේරුකාර්යාලය (කලාපය 6 ) ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, අංක 10, ඉහළ ඩික්සන් පාර, ගාල්ල |
| **දුර.94 91 223 4838** | ෆැක්ස් 94 91 223 4838 |
| **විද්‍යුත් තැපෑල** | **ceg@buildingsdept.gov.lk** |




# කාර්ය සාධනය

*වගුව 11 6 කලාපයේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ ප්‍රගතියේ සාරාංශය*

| | කාර්ය නිෂ්ධාව | උපදේශනය | ව්‍යාපෘති කළමනාකරණය | නඩත්තුව | වැඩිදියුණු කිරීම් | එකතුව |
|---|---|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය(මිලියන) | 79.43 | 67.16 | 181.00 | 42.11 | 3.05 | 372.75 |
| මූල්‍ය ප්‍රගතිය (මිලියන) | 73.32 | 56.10 | 167.57 | 39.52 | 2.41 | 338.92 |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 7 | 1 | 1 | 19 | - | 28 |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 6 | 9 | 7 | - | 2 | 24 |

# සම්පූර්ණ කළ ව්‍යාපෘති

| කම්කරු දෙපාර්තමේන්තුව සඳහා නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම - බෙලිඅත්ත (II අදියර) | | රිදියගම සෆාරි උද්‍යානයේ පිරිමි නිල නිවාසයක් ඉදි කිරීම | |
|---|---|---|---|
| **මුළු තක්සේරු මුදල පිරිවැය** | මිලියන 61.73 | මුළු තක්සේරු මුදල | මිලියන 22.50 |
| **සේවාදායකයා** | කම්කරු සහ වෘත්තීය සබඳතා අමාත්‍යාංශය | සේවාදායකයා | තිරසර සංවර්ධනය සහ වනජීවී අමාත්‍යාංශය |
|  | |  | |

# මානව සම්පත්

| කළමනාකරණ කාර්ය මණ්ඩලය | අනුමත | පිරවූ | පුරප්පාඩු | මෙහෙයුම් කාර්ය මණ්ඩලය | අනුමත | පිරවූ | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 | ප්‍රධාන ඉංජිනේරු | 15 | 8 | 7 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉංජි.සේ) | 1 | 0 | 1 | ජ්‍යෙෂ්ඨ වාස්තු විද්‍යාඥයන් | 2 | 0 | 2 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉදි. සේවා.) | 1 | 0 | 1 | ඉංජිනේරුවන් | 70 | 44 | 26 |
| අධ්‍යක්ෂ- ඉංජිනේරු සැලසුම් | 1 | 1 | 0 | වාස්තු විද්‍යාඥ/ අභ්‍යන්තර අලංකරණ ශිල්පීන් | 12 | 10 | 2 |
| අධ්‍යක්ෂ-වාස්තු වි. | 1 | 0 | 0 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 1 | 0 | 1 |
| අධ්‍යක්ෂ - තාක්ෂණ සංවර්ධන | 1 | 1 | 0 | පරිපාලන නිලධාරී | 1 | 0 | 1 |
| අධ්‍යක්ෂ ඉදිකිරීම් | 2 | 2 | 0 | තාක්ෂණ නිලධාරීන් | 94 | 52 | 42 |
| අධ්‍යක්ෂ පරිපාලන | 1 | 1 | 0 | සැලසුම් ශිල්පීන් | 40 | 29 | 11 |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | 0 | තාක්ෂණික සහකාරවරුන් | 40 | 0 | 40 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 | ප්‍රමාණ සමීක්ෂණ සහකාරවරුන් | 13 | 13 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ පරිපාලන | 1 | 1 | 0 | සංවර්ධන නිලධාරීන් | 37 | 36 | 1 |
| ගණකාධිකාරී | 5 | 4 | 1 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 80 | 52 | 8 |
| **එකතුව** | **17** | **13** | **4** | **එකතුව** | **405** | **244** | 161 |
| | | | | **වෙනත්** | **180** | 126 | 54 |
| **අනුමත සේවක සංඛ්‍යාව** | **602** | **ලද හැකි** | **383** | **පුරප්පාඩු** | **219** | | |

# මානව සම්පත්-ශක්තිය

දෙපාර්තමේන්තුව සතු අතිමහත් ශක්තිය වන්නේ සිවිල්, විද්‍යුත් සහ යාන්ත්‍රික ක්ෂේත්‍රයන් ගේ වරලත් ඉංජිනේරුවරුන් සහ වරලත් වාස්තු විද්‍යාඥයන්, අභ්‍යන්තර නිර්මාණ ශිල්පීන් සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය යනාදී බහු වෘත්තික කාර්ය මණ්ඩලයයි.

ප්‍රධාන ඉංජිනේරුවන් 08 දෙනෙක්, ඉංජිනේරුවන් 44ක්, වාස්තු විද්‍යාඥ/අභ්‍යන්තර නිර්මාණ ශිල්පීන් 10, තාක්ෂණ නිලධාරීන් 52, සැලසුම් ශිල්පීන් 29 ක් හා ප්‍රමාණ සමීක්ෂණ සහකරුවන් 13 කගෙන් සමන්විත වෘත්තීය ඒකක ගණනාව වෘත්තීමය ලෙස යොදාගනිමින් දෙපාර්තමේන්තුව තම සේවය ලබා දෙයි.

ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත වැඩකටයුතුවල උපදේශන ආයතනය සහ පූර්ණ බලාධිකාරිය ලෙස මෙම වෘත්තීය කණ්ඩායම ගොඩනැගිලි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී  සහ ඒවායේ නීතිමය කටයුතු සම්බන්ධයෙන් විශේෂඥ උපදෙස් ලබාදීම සඳහා කැඳවනු ලබයි.

ඵලදායී නායකත්වය, සේවකයන් අතර සහයෝගය වැඩි කර ඉලක්ක සැපිරීම සඳහා සම්පත් යොදාගනිමින් ජයග්‍රහණ කරා ළඟා වීමට ඉවහල් වෙයි.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හැකියාවෙන් පිරි, ස්ථාවර සහ සක්‍රිය නායකත්වයක් ලැබීමේ භාග්‍යය උදාකරගෙන ඇති අතර, ඔවුන් නොමැතිනම් ප්‍රගතිය සිහිනයක් වනු ඇත.

මෙහි පවතින එකම තර්ජනය වන්නේ පුද්ගලික අංශය සහ විදේශයන්හි පවතින ආකර්ෂණය හේතුවෙන් තාක්ෂණික කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තුව හැර යාමයි.

සංවිධානයේ වර්ධනය, ඵලදායීතාව සහ කාර්යක්ෂම බව වැඩි කරන මෙවන් තාක්ෂණිකව නිපුණ වෘත්තීය කාර්ය මණ්ඩලය රඳවාගැනීම සඳහා දිරි දීමනා සැලසුමක් හෝ සම්මානයට ලක් කිරීමේ ක්‍රමයක් තිබිය යුතුය.

මෙම දීපව්‍යාප්ත සේවා තනතුරු සහ දෙපාර්තමේන්තුගත තනතුරු හොබවන සියල්ලන්ම එකතුව  2016 ක්‍රියාකාරී සැලසුම සාක්ෂාත් කරගැනීම සඳහා තම භූමිකාව ඉටු කරමින් පවති.

# ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ ප්‍රකාශය

### අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය 2015 ජූනි මස ස්ථාපිත කරන ලදී.

### අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන පරමාර්ථය -

මුදල් රෙගුලාසි 133 යටතේ අභ්‍යන්තර විගණන අංශ සඳහා වූ ප්‍රධාන පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා වාර්ෂිකව විගණන සැලසුම් සකස් කර, අනාවරණය වන කරුණු අනුව අභ්‍යන්තර පාලන පද්ධති හඳුන්වා දීම හා ආයතන සංග්‍රහයේ II වන කණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 29 වැනි ඡේදය අනුව කටයුතු කිරීම.

### කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | - එස්.නරසිංහ මෙය |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | - ඩබ්.පී. ජයන්ත රුද්‍රිගු මයා |
| රාජ්‍ය කළමනාකරණ සහකාර III | - කේ.එල්.ඩී.එම්.අමරසිංහ මයා |
| කාර්යාල කාර්ය සහායක | - ඒ.ඒ.ගාමිණී තිලක් මයා |

### අභ්‍යන්තර විගණක වාර්ථාව - 2016

සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ලද අභ්‍යන්තරවිගණන සැලසුම, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී.
විගණක විසින් ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා 53 ක් ඉදිරිපත් කරනු ලැබ ඇත. මෙම වාර්තා වල පිටපත් මසකට වරක් අමාත්‍යාංශ ලේකම් වෙතද, මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව විගණකාධිපති වෙතද ඉදිරිපත් කර ඇත.
සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් පවත්වා ඇත.
ඊට අමතරව පහත විෂයන්ට අනුකූලව වාර්තා ඉදිරිපත් කර ඇති අතර, වාර්තා ප්‍රමාණයද ඉදිරියෙන් දක්වා ඇත.

- නීති-රීති රෙගුලාසි වලට අනුකූල නොවීම - 30
- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පරීක්ෂාව - 01
- අධ්‍යක්ෂ ජනරාල් පෞද්ගලික ගිණුම් පරීක්ෂාව - 01
- පද්ධති පාලන පරීක්ෂා කිරීම - 10
- වත්කම් පරීක්ෂා කිරීම් - 02
- ප්‍රධාන ඉංජිනේරු කලාප කාර්යාල පරීක්ෂාව - 07
- විශේෂ විමර්ශන - 02

# විගණකාධිපති වාර්තාව

**ශීර්ෂය 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 04 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 353.04 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 345.36 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 7.68 ක් හෙවත් සියයට 2.18 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 315.54 | 308.99 | 6.55 | 2.07 |
| මූලධන | 37.50 | 36.37 | 1.13 | 3.02 |
| එකතුව | 353.04 | 345.36 | 7.68 | 2.18 |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 30901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 18.00 | 17.99 | 11.00 | 13.82 | 75.00 | 47.56 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0067/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 5.56 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 03 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 1,130.53 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0016/0033/000 | 148.77 |
| 6000/0000/00/0013/0052/000 | 981.03 |
| 6000/0000/00/0002/0012/000 | 0.73 |
| | 1,130.53 |

## 2.5 විගණන නිරීක්ෂණය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3.** **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1** **විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 93 දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි .

**3.2** **පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.මිලියන 53.66 ක තැන්පතු 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.3** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 30901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 378,650 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 04 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වි තිබුණි.

(ආ) 2012 වර්ෂයේ දී විශ්‍රාම ගිය නිලධාරිනියකගේ රු.238,330 ක් වූ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි.

**3.4** **යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරිම සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම 2016 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**3.5** **අනුකූල නොවීම්**

**------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**------------------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| --------------------------------- | ------------ | -------------------- |
| | රු. | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>--------------------------------- | | |
| මුදල් රෙගුලාසි 94(1) | 461,444 | වැය විෂයන් 03 ක ප්‍රතිපාදන මුදල් ඉක්මවා බැරකම් වලට බැඳී තිබුණි. |
| මුදල් රෙගුලාසි 104(3) | 477,605 | පරීක්ෂණ මණ්ඩල පත්කිරීම ප්‍රමාද වී තිබුණි. |
| මුදල් රෙගුලාසි 396(ඇ) | 297,857 | මාස 6 ක් ඉක්ම වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. |

**3.6** **කාර්යසාධනය**

**------------------**

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

**---------------------------------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

ජනතාවට විශිෂ්ඨ සේවාවක් ලබාදීම පිණිස සුරක්ෂිත වූද, පිරිමැසුම් දායක වූද, තිරසාර හා විශිෂ්ඨ ලෙස නිම වූ ගොඩනැගිලි පරිසරයක් රාජ්‍ය අංශයේ ආයතනවලට ලබාදෙමින් ගොඩනැගිලි තාක්ෂණයේ ප්‍රමුඛයා බවට පත්වීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දැක්ම වී තිබුණි. එසේම තාක්ෂණික වගකීම, ගුණාත්මකභාවය, පිරිමැසුම්දායක බව අපේක්ෂිත ගුණාංග හා තිරසාර බව සාක්ෂාත් කරමින් තම සේවාදායකයින් පූර්ණ තෘප්තියට පත්කිරීම උදෙසා විවිධ ව්‍යාපෘතීන් හි නිපුණ, එසේම තත්කාර්යයන් සඳහා ඇපකැප වූ වෘත්තිකයින් පිරිසක් විසින් වාස්තු විද්‍යාත්මක සහ ඉංජිනේරුමය නිර්මාණ ද, ඉදිකිරීම්, නඩත්තු කිරීම්, ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික උපදෙස් සැපයීම මඟින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යයන් වැඩිදියුණු කිරීම් වස් විශිෂ්ඨ සේවාවක් සැපයීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර කරගෙන තිබුණි.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා බලතල පිළිබඳ මුදල් රෙගුලාසි 787 සිට 789 දක්වා විස්තර කර තිබෙන අතර මුදල් රෙගුලාසි අනුව රජයේ ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කටයුතු කළයුතු බව දක්වා තිබුණි.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි දක්වා තිබුණි.

- රජයේ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය ආයතන සඳහා ගොඩනැගිලි සහ අනෙකුත් සේවාවන්ට අවශ්‍ය සැලසුම් සැකසීම ඇස්තමේන්තු සැකසීම සහ ඉදිකිරීම.
- ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රාජ්‍ය ආයතන සඳහා උපදේශාත්මක සේවාවන් සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම.

- රජයේ දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශවල ගොඩනැගිලි නඩත්තු කටයුතු, අළුතින් එකතු කිරීම හා වැඩි දියුණු කිරීමේ කාර්යයන් ඉටුකිරීම.
- ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සඳහා ගොඩනැගිලි ඉදිකිරීම සහ පුනරුත්ථාපන කාර්යයන් ඉටුකිරීම.

එසේ වුවද දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන සියලුම කොන්ත්‍රාත්තු උප කොන්ත්‍රාත් ක්‍රමයට කිරීම සඳහා විවිධ කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී තිබුණි. දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1,514 ක් වූ Turnkey ඉදිකිරීම් කොන්ත්‍රාත් ව්‍යාපෘති 52 ක් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබූ අතර ඒ සියල්ල උප කොන්ත්‍රාත් ක්‍රමයට ඉටු කර තිබුණි. මෙම ව්‍යාපෘති අතුරින් 2016 දෙසැම්බර් 31 දිනට කාර්ය නිමකළ යුතු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 154.37 ක් වූ ව්‍යාපෘති 06 ක කිසිඳු කාර්යසාධනයක් ඉටු කර නොතිබුණු අතර ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 178.35 ක් වූ ව්‍යාපෘති 08 ක කාර්යසාධනය සියයට 5 ක් වැනි අඩු මට්ටමක තිබුණි. තවද ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 226.6 ක් වූ ව්‍යාපෘති 04 ක ඉටු කරන ලද කාර්යසාධනය සියයට 43 සිට 50 දක්වා විය.

**3.7 පාඩු හා හානි**

----------------

2016 මාර්තු 29 දින අනතුරට පත් වූ වාහනය 2016 වර්ෂය අවසානය දක්වාම අළුත්වැඩියා නොකිරීම නිසා රක්ෂණයෙන් රු.193,350 ක පාඩුව ආවරණය කර ගැනීමේ හැකියාව අහිමි වී තිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

--------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 116 | 75 | 41 |
| (ii) | තෘතියික මට්ටම | 23 | 01 | 22 |
| (iii) | ද්විතියික මට්ටම | 285 | 182 | 103 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 178 | 125 | 53 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 10 | - |
| | **එකතුව** | **602** | **393** | **219** |

පුරප්පාඩු සංඛ්‍යාව 219 ක් වීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට සෘජුවම බලපා තිබුණි.